# සීයයි මුනුබුරයි



සීයාහ්... සිංගප්පූරුවෙ කුඩු ජාවාරං කාරයො නැතුව ඇති නේහ්..

අනේ මන්දා්... නැතිම වෙන්න නං බෑ... මරණ දඬුවම නියම කරලා් තියෙන්නෙ ඉන්න හින්දනේ ඒත් ඕස්ට්‍රේලියාවෙ වගේ නැතුව ඇති..

හොඳයි ඉතින් සිංගප්පූරියෙක් කුඩුත් එක්ක ඕස්ට්‍රේලියා-වෙදි අහු උණොත්....

ඈ... මෙහේ නීතියට අනුව නඩු අහලා් වැරදිකාරයයි කියලා ඔප්පු උනොත් හිර ගෙට යවාවි..

කොච්චර කල්..?

මාසයක් දෙකක් ... නැත්නං තුනක්...

සිංගප්පූරුවෙ නීතියට නෙවේද නඩු අහන්නෙ..? ඒ ආන්ඩුව කිව්වොත් එයා අපේ රටේ මිනිහෙක්.. ඒක හින්දා ඔය මිනිහට මරණ දඬුවම දෙන්න කියලා....

න්.. නෑ.. ඒ හ් හෙ ම වෙන එක්කක් නෑහ්....

වික


නැවුම් පුවත් හරවත් කතා බහ
දෙස් විදෙස් කාලීන සිද්ධීන් මියුරු සංගීතය

ලක් හඬ
FM 97

සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා

ඔබේ හඬ - ලක් හඬ




## ශ්‍රීනාත් මද්දුමගේ

# කිතුණු දහමෙන් නාට්‍ය කලාවට ලැබූ ආභාෂය

මේ කිතුනු මාසයේ දී නාට්‍ය කලාවට කිතුණු දහමෙන් ලැබූ ආභාෂය පිළිබඳව විමසා බැලීම සුදුසු යයි සිතමි. 1505 දී පෘතුගීසින් විසින් මුහුදු බඩ පළාත් වල බලය ව්‍යාප්ත කිරීමත් සමග ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වූ කිතු දහම 1815 දී ඉංග්‍රීසි ආක්‍රමණයත් සමග ශ්‍රී ලංකාව පුරා පැතිරෙන්න පටන් ගති. කිතුණු ව්‍යාප්තියත් සමග එමගින් නාට්‍ය කලාවට ඇති කළ බලපෑම කැපී පෙනෙන සුළුය.

යේසු තුමාගේ උපතේ සිට කුරුසියේ වධයට පාත්‍රවීමද, මරණයෙන් උත්ථානය වීමද දැක්වෙන කථා පුවත් මෙන්ම කිතු දහම වෙනුවෙන් කැපවුණු සාන්තුවරයන් ගැන පුවත් වලින් කිතුනු දහම පෝෂණය වී ඇත. මේ අගනා සාහිත්‍ය උරුමය පදනම් කොටගෙන නාට්‍ය නිර්මාණය කිරීම යුරෝපය පුරා පැතිර ගොස් ඇත.

ක්‍රිස්තු වර්ෂ ආරම්භ යුගයේ දී ගෘහ නිර්මාණ කලාවේ සහ චිත්‍ර කලාවේ වර්ධනයක් ඇති වුවද නාට්‍ය කලාවේ උන්නතියක් ඇති නොවූ බව සාමාජීය විශ්වාසයයි. ඒ කාලයේ ........ සමාජයේ වැදගත් තැනක් හිමි නොවූ බවද වාර්තා වේ. එහෙත් කල්ගතවත්ම පල්ලියේ පූජා කර්ම සඳහා නාට්‍යමය ලක්ෂණ එක්විය. 10 වන සියවසේ දී පමණ පල්ලිය මුල් කරගෙන නාට්‍ය කලාවක් බිහි වූ බවත් 13 වන සියවසේ දී පමණ යුරෝපයේ පල්ලි ආසන්න එළිමහන් භූමිවල බයිබලයේ කතා පුවත් රඟ දැක්වූ බවත් වාර්තා වේ. එය ආගම් භක්තිය ප්‍රකාශ කිරීමේ මාධ්‍යයක් මෙන්ම ආගම ප්‍රචාරය කිරීමේ මාධ්‍යයක් බවට පත්විය. ලතින් බසින් කල ආගමික වතාවත් තේරුම් ගැනීමට වාචිත ආයතන ඉක්මවා අනෙක් ආයතනයන් භාවිතා කරගත හැකි බව පූජකවරු වටහා ගත්තා විය යුතුය.




ශ්‍රී ලංකාවට පැමිණි කිතුණුවන් ලංකාවේ කිතුණු දහම ප්‍රචාරය කිරීම සඳහා නාට්‍ය මාධ්‍ය යොදා ගත්හ. ශ්‍රී ලංකාවට පැමිණි ජේසු නිකායික පූජකවරු 1602 හා 1604 වර්ෂ වල කොළඹ දේවස්ථානයක වාර්ෂික මංගල්‍යෝත්සවය වෙනුවෙන් නාට්‍ය රඟ දැක්වූ බව වාර්තා වේ. සිංහල ජනයා වෙසෙන පළාත් වල සිංහලෙන් ද දෙමළ ජනයා වෙසෙන පළාත් වල දෙමළෙන් ද එම නාට්‍ය රඟ දැක්වා ඇත. කිතුණු නාට්‍ය බොහෝවිට රඟ දැක්වූයේ මුහුදු බඩ පළාත් වලයි.

සිංහල සහ දෙමළ මැනවින් උගත් ජාකෝමේ සාන්සාල්වේස් පියතුමා කිතුදහම සිංහල භාෂාවට පෙරළීමෙහි ලා පුරෝගාමියා ලෙස සැලකේ. ආචාර්ය පී.බී. සන්නස්ගලයන් දක්වන ආකාරයට එතුමා එවකට පැවති ගැමි වහර සමග සංකලනය වූ වාග් වින්‍යාසයකින් කිතුණු දහම සිංහලට පරිවර්තනය කර ඇත. ගොන්සල්වේස් පියතුමාගේ පසන් පොතේ කවි අපේ ජන කවිවල ආභාෂය ලබා ඇති අතර ඒවා නාට්‍යමය අනුසාරයෙන් නිරූපනය කිරීමට උචිත විය. සිංහල පාස්කු නාට්‍යයේ භාෂා නිර්මාණය වූයේ එම සිංහල කෘතීන් ගේ ආභාෂයෙනි. ආචාර්ය සරච්චන්ද්‍රයන් ප්‍රකාශ කරන අන්දමට මුල්ම පාස්තු නාටයය මින් වසර තුන් හාර සියයකට පෙර මන්නාරම් පලාතේ පේසාලයි ගමෙහි ප්‍රදර්ශනය වී ඇත. ශ්‍රී ලංකාවට පාස්කු නාට්‍ය පැමිණියේ ඉන්දියේ ගෝවේ සිටයි. ගෝවේ දෙමළ බසින් කළ පාස්කු නාට්‍යය පේසාලයි හිදී දෙමළ බසින්ම ප්‍රදේශීය නමවත් යොදා ගෙන රංග ගත කරන්නට ඇතැයි සිතිය හැක. මුල්ම පාස්කු නාට්‍ය රූකඩ මාධ්‍ය යොදාගෙන රඟ දක්වන ලදැයි විශ්වාස කෙරේ.

කිතුණු ජන නාට්‍ය අතර පාස්කු නාට්‍ය අදත් ජීවමාන නාට්‍ය විශේෂයකි. 1728 දී ගොන්සාල්වේස් පියතුමාගේ ............... මත මුල්වරට දුටුවේ පාස්කු සංදර්ශනය ආරම්භ වූ බවද සැලකේ. මීගමුව දුටුවේ පාස්කු නාටකය පිළිබඳ පර්යේෂණ කල ක්ලෙමන්ට් ප්‍රනාන්දු සිංහල ජන නාටක වංශයේ අපූර්වතම ශාඛාවක් වන පාස්කු නාටක කලාවේ ඉපැරණිම දේශීය මුලදර්ශනය දුටුවේ පාස්කු නාටකය බව සඳහන් කරයි.
ක්‍රිස්තුන් වහන්සේ කුරුසියේ ඇණ ගැසීම හා උන්වහන්සේ මරණයෙන් උත්ථාපනයවීම වාර්ෂිකව සිහිපත් කරන පාස්කු කාලයේ බස්නාහිර පළාතේ හා උතුරු නැගෙනහිර පළාත් වල මුහුදු තීරයේ අදත් පාස්කු නාට්‍ය රඟ දැක්වෙයි. මෙම පාස්කු නාට්‍ය අද යම් නවීකරණයකට ලක්ව තිබුණද එහි තිබූ යම් සාම්ප්‍රදායික ලක්ෂණ ඉන් ගිලිහී නොමැත.

**පාස්කු නාට්‍යයේ එන ගායනයක්**

**ගායනය** : සුරලොවින් බැස මෙදිනේ
මවු කුසින් බිහි සෙමිනේ
මව් දෙතනේ කිරි බොමිනේ
මිණි පලසිනේ වැඩුණු තැනේ
දිලෙන රනේ රුව ලෙසිනේ
මල් උයනේ සිටිය දිනේ

මෙම මරණේ ඔබට වුනේ
කිමද අනේ දෙව් රජුනේ
වරලස රන් කෙදි වැන්නේ
ඔය වඩමින් දිලිසෙන්නේ
තුන්ලොව සියලු සතුන්නේ
මෙත් සිත ලොව වඩවන්නේ
කටු ඔටුනුත් ගෙන උන්නේ
සිරස ගසා වස් වන්නේ
මේ දුක් දැක කුමරුන්නේ
කෙලෙසද මම වදවෙන්නේ

**පාස්කු නාට්‍යවල එන දෙබස් කීපයක්**

සොදෙවුන් : කයිපාස් ඉ කයිපාස් අපි ඉවරයි අපි විනාසයි දවසින් දවස ජේසුතුමා කරා ඇදී යන සෙනඟ ඔබ දුටුවා නම්.........

කයිපාස් : ජේසුතුමා කරා ඔය තරම් සෙනඟ ඇදී යන්නේ කුමක් නිසාදැයි තුමුලා සොයා බැලුවාද?

ජෝපාජ් : සොයා බැලුවා කයිපාස් එතුමා කතා කරන්නේ සත්‍යත්...... එකයි

සොදේවුන් : උඹට පිස්සු ජෝශප් ඉ එතුමා කෙරෙහි කිසිම සත්‍යක් නැති බව මා දුටුවා

ෂයිරෝ : ඔහු සහ ඔහුගේ අනුගාමිකයන් සුදානම් වන්නේ නායක පූජකයන් බලෙන් නෙරපන්න

කයිපාස් : නුඹ හරි ෂයිරො ඉ නුඹ හරි මගේ මිත්‍රවරුනි එසේ නම් අප කළ යුත්තේ කුමක්ද?

**(ලබන කලාපයේ පාස්කු නාට්‍ය ගැන විමසීමක්)**